**ජාතික රක්ෂණ භාර අරමුදල - 2021**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 වියාචනය කළ මතය

ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය ("අරමුදල") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 වියාචනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්:

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකාරිත්වය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ ව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතී රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ.) පහත සඳහන් හේතූන් නිසා දූර්වල පාලන පරිසරයක් නිරීක්ෂණය විය.<br>(i) ආයතනයේ ප්‍රධාන කළමනාකරණ තනතුරු හතරින් (04) තනතුරු තුනක් (03) පුරප්පාඩු ලෙස පවතී. අදාළ නිළධාරීන්ගේ ස්ථිර වගකීම්වලට අමතරව ප්‍රධාන විධායක නිලධාරී සහ සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය යන තනතුරු සඳහා වැඩබලන පදනමින් නිළධාරීන් අනුයුක්ත කර තිබුණි. සහකාර සාමාන්‍යාධිකාරී - මෙහෙයුම් තනතුර 2016 නොවැම්බර් 01 වන දින, එනම් සේවක සංඛ්‍යාව අනුමත කළ දින සිට පුරප්පාඩුව පවතී. තව දුරටත්, කළමනාකාර තනතුරු හත (07) න් තනතුරු පහක් (05) පුරප්පාඩු වී තිබූ අතර කළමනාකාර තනතුරු තුනක් (03) අදාළ නිළධාරීන් ගේ ස්ථිර වගකීම්වලට අමතරව වැඩබලන පදනම මත පුරවා තිබුණි. එබැවින් අභ්‍යන්තර පාලනයන් වර්ධනය කිරීමේ හැකියාව, අභ්‍යන්තර පාලන පද්ධතිය ඵලදායි ලෙස අධීක්ෂණය කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා වන හැකියාව අවම වේ. | ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආයතනයේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා එම පුරප්පාඩු පිරවීම අත්‍යවශ්‍ය වුවද, ආයතනය විසින් පුරප්පාඩු වූ සියලුම තනතුරු සඳහා බඳවා ගැනීමේ ක්‍රියාවලීන් සිදු කර ඇත. තව දුරටත්. රජය 2019 සිට සියලුම බඳවා ගැනීම් නතර කර ඇත. කෙසේ වෙතත්, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිත මෙම ගැටලුවේ බරපතලකම හේතුවෙන් පුරප්පාඩු වූ තනතුරු බඳවා ගැනීම සඳහා අරමුදල රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ විශේෂ අනුමැතිය ලබාගෙන ඇත. ඒ අනුව, බඳවා ගැනීමේ ක්‍රියාවලිය දැනටමත් ආරම්භ කර ඇති අතර 2023 පළමු කාර්තුවේදී පුරප්පාඩු පිරවීමට අපේක්ෂා කරයි. | ප්‍රධාන කළමනාකරණ තනතුරු පිරවීමට සහ පාලන පරිසරය ශක්තිමත් කිරීමට කළමනාකාරිත්වය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| **(ii)** බඳවා ගැනීමේ පටිපාටියේ දක්වා ඇති වගකිව යුතු අංශ සහ එම කාර්යයන් ඉටු කිරීම සඳහා සුදුසු කුසලතා ඇති නිළධාරීන් නොමැති වීම හේතුවෙන් ජීව සණක ක්‍රියාවලිය, අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සහ ආයෝජන ක්‍රියාවලිය ඵලදායි ලෙස සිදු කර නොතිබූ බව නිරීක්ෂණය විය. එබැවින්, අවදානම් කාලෝචිත ලෙස හඳුනා ගැනීම සහ එම අවදානම් අවම කිරීම සඳහා උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම, ජීව සණක | ජීව සණක ක්‍රියාවලිය, අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය, ආයෝජන ක්‍රියාවලිය සඳහා කැපවූ කාර්ය මණ්ඩලයකින් පුරවා නොතිබුණද, එම කාර්යයන් සාර්ථකව හා ඵලදායි ලෙස සිදු නොකළ බවක් හෝ කිසිසේත් ක්‍රියාත්මක නොවූ බවක් අදහස් නොවන බව සඳහන් කළ යුතුය. | එම කාර්යයන් ඵලදායී ලෙස පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සම්පත් සහිතව එම ප්‍රධාන අංශ පිහිටුවීමට කළමනාකාරීත්වය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය<br>. |

| | | |
|---|---|---|
| ඇස්තමේන්තු කිරීම සඳහා නිවැරදි තොරතුරු සැපයීම ඵලදායී නොවිය හැක. | | |
| (iii) අභ්‍යන්තර විගණන කාර්යය 2020 පෙබරවාරි සිට 2021 ඔක්තෝබර් දක්වා (මාස 20) සිදු කර නොතිබූ අතර 2021 වසර සඳහා විගණන කමිටුව පවත්වා නොතිබුණි. එබැවින් අභ්‍යන්තර පාලන පද්ධති නිරන්තරයෙන් සමාලෝචනය කර ශක්තිමත් කිරීම, මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම සහ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ ක්‍රියාවලිය සිදු කර නොතිබුණි. | මෙම අංශයේ ප්‍රධානියාගේ පුරප්පාඩුව හේතුවෙන් අභ්‍යන්තර විගණනය හා විගණන කමිටුව ක්‍රියාත්මක නොවූ බවට ජාතික රක්ෂණ භාර අරමුදල එකඟ වේ. 2021 වර්ෂය තුළ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් අදාළ තනතුර පිරවීම සහ විගණන කමිටුවේ පැවැත්වීම ප්‍රමාද විය. | විගණන කමිටුවේ හා අභ්‍යන්තර විගණනයේ ඵලදායී ක්‍රියාකාරීත්වය කළමනාකාරීත්වය විසින් සහතික කළ යුතුය |
| (iv) අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමයේ සේවකයකු විසින් සිදු කරන ලද වංචාවක් 2022 ඔක්තෝබර් මාසයේදී අහම්බෙන් අනාවරණය වී ඇත. මෙම වංචාව 2018 වර්ෂයේ සිට සිදු කර ඇති අතර නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන වෙත ඉදිරිපත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තාවට අනුව අනාවරණය වූ මූල්‍ය පාඩුව රු. 5,136,000 කි. නිසි සුපරීක්ෂණයක් සහ අධීක්ෂණයක් සහිතව අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් ලෙස සැලසුම් කර ක්‍රියාත්මක නොකිරීම නිසා මෙය සිදු වී ඇති බව නිරීක්ෂණය වේ. තවද, අරමුදල සඳහා ශක්තිමත් පාලන පරිසරයක් නොමැති බව මෙයින් පැහැදිලි වේ. තවද, මේ සම්බන්ධයෙන් වත්මන් තත්ත්වය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | වංචාව සම්බන්ධයෙන් මූලික විමර්ශන කටයුතු අවසන් කර ඇති අතර වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නියමිතයි. මෙම වංචාව සේවකයා විසින් පිළිගෙන ඇති අතර මූල්‍ය අලාභය රු. 5,136,000ක් මහේස්ත්‍රාත් අධිකරණයට ගෙවා ඇති අතර එය නිසි ක්‍රියාපටිපාටිවලින් පසුව අරමුදලට අයකර ගනු ලැබේ. | වංචා අවදානම අවම කිරීමට සහ වංචා වළක්වා ගැනීමට කළමනාකාරීත්වය විසින් නිසි අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මක කිරීම සහතික කළ යුතුය |
| (ආ.) අග්‍රහාර හිමිකම් ඉල්ලුම්පත්‍ර භාරගැනීමේ සිට හිමිකම් පියවීම දක්වා සහ අග්‍රහාර හිමිකම්වල බැරකම් හඳුනාගැනීම සඳහා, හිමිකම් කළමනාකරණය කිරීමේ ඒකාබද්ධ පද්ධතියක් අරමුදලට නොතිබුණි. එබැවින් වගකීම් විරහිත ලෙස හිමිකම් අයදුම්පත් භාර ගැනීම හේතුවෙන් හිමිකම් තොරතුරු නැතිවීම සහ හිමිකම් සැකසීමේ අනවශ්‍ය ප්‍රමාදයන් නිරීක්ෂණය විය. | කෙසේ වෙතත්, අග්‍රහාර හිමිකම් අංශය ක්‍රියාත්මක වන්නේ හිමිකම් ක්‍රියාවලියේ ප්‍රථම අදියර වන හිමිකම් වගකීම් භාර ගැනීම සහ හඳුනා ගැනීම හැර ඒකාබද්ධ පද්ධතියක් මඟිනි. හිමිකම් සැකසුම් පද්ධති වෙනස් කිරීම්වල මෙම ආරම්භක අදියර 2022-2025 ආයතනික සැලැස්මේ සලකා බැලූ අතර එය දැනට ප්‍රගතියක් ලබමින් පවතී. | අග්‍රහාර රක්ෂණ ක්‍රමය සඳහා නිසි අභ්‍යන්තර පාලනයක් හඳුන්වා දීමට කළමනාකාරීත්වය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ.) වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදී අරමුදලේ (SRCC සහ Tr අරමුදල) ගනුදෙනු මූලාශ්‍ර ලේඛන භාවිතා කරමින් පැතුරුම්පත්වල සටහන් කර ඇති අතර වසර අවසානයේදී පැතුරුම් පත්වල සටහන් වූ සියලුම ගනුදෙනු අතින් සකස් කළ ලෙජරයකට පිටපත් කර විගණනයට ඉදිරිපත් | SRCC වාරිකය ඉන්වොයිස් කිරීමේ ක්‍රමය SAGE ගිණුම්කරණ පද්ධතියට නොගැලපෙන අතර, SAGE හි GL එක වරක් යාවත්කාලීන කිරීමේ දුෂ්කරතාවයට හේතු විය. කෙසේ වෙතත්, 2023 දී SRCC වෙත මාර්ගෝපදේශ නිකුත් කිරීමෙන් පසුව, | මූල්‍ය තොරතුරු පද්ධති කාලානුරූපව යාවත්කාලීන කිරීම සහ තොරතුරු වල විශ්වාසනීයත්වය සහතික කිරීම කළමනාකාරීත්වය විසින් සහතික කළ යුතුය. |

| | | |
|---|---|---|
| කර ඇත. 2019 වර්ෂයේදී අරමුදල ගිණුම් තැබීම සඳහා භාවිතා කරන "සේජ්" ගිණුම්කරණ පද්ධතිය තුළ මෙම පහසුකම සපයා තිබුණද, එම පහසුකම වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදී අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සඳහා කාලීන පදනම මත යොදාගෙන නොතිබුණි. එබැවින් දත්ත සැකසීමේ ක්‍රියාවලියේදී පද්ධති අතර වැඩ හා දත්ත ද්වීගනණය වීමේ ඉහළ සම්භාවිතාවක් හා වැරදි සිදුවීමේ ඉහල අවදානමක් පැවතිම. තවද, ඒකාබද්ධ කිරීම් වලදී දත්ත වැරදීමේ ඉහල සම්භාවිතාවක් ඇති බව නිරීක්ෂණය විය. | NITF විසින් සෑම මසකම අවසන් වීමෙන් පසු දින 10ක් ඇතුළත සාමාන්‍ය රක්ෂණ සමාගම්වලින් වාරික තොරතුරු රැස් කරයි. NITF විසින් රක්ෂණ සමාගම් වෙත මාර්ගෝපදේශ නිකුත් කර ඇති බැවින්, මෙම අතිරේක පාලනය අත්හිටුවනු ඇත. තවද, මෙම සමාන්තර කාර්යය GL ශේෂයන් හරස් පරීක්ෂා කිරීම සහ අත්පොත පද්ධතියේ දෝෂ තිබේ නම් හඳුනා ගැනීම සහතික කරයි. මෙම අනුපිටපත වාර්තා කිරීමේ අවදානම් අවම කිරීමේ ක්‍රමයක් වන අතර ඇත්ත වශයෙන්ම මෙය GL සහ සංඛ්‍යාවල නිරවද්‍යතාවය සහතික කරන බැවින් මෙය යම් ආකාරයක පාලනයකි. | . |
| (ඇ.) අග්‍රහාර රක්ෂණාවරණයේ වාරික මුදල් ගෙවීමේදී සහ හිමිකම් පෑමේදී සාමාන්‍ය, රිදී සහ රන් යෝජනාක්‍රම තුනම සඳහා එක් ආදායම් සහ එක් වියදම් අයිතමයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන තිබුණි. නිසි සහ යාවත්කාලීන දත්ත පද්ධතියක් නොමැති බැවින්, අරමුදලට කරන ලද දායක මුදල්, එක් එක් අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමවලින් ගෙවන ලද හිමිකම් පෑම් සඳහා සාක්ෂි ලබා ගැනීම මෙන්ම එක් එක් ආයතනය විසින් සහ එක් එක් රක්ෂණ ඔප්පු හිමියා විසින් රක්ෂණ අරමුදල වෙත මාසිකව කරන ලද දායක මුදල් පිළිබඳ සවිස්තර වාර්තාවක් ලබා ගැනීම දුෂ්කර ය. | සවිස්තරාත්මක යාවත්කාලීන දත්ත පදනමක් නොමැතිකම යන පදනම මත නිරීක්ෂණ සමග එකඟ විය. කෙසේ වෙතත්, පවතින ක්‍රමය තුළ, ආයතන කිහිපයක් හැර අග්‍රහාර සාමාන්‍ය, රිදී සහ රන් වාරික වෙන වෙනම ලබා දිය හැකිය. කෙසේ වෙතත් මුදල් අමාත්‍යාංශයේ අනුග්‍රහය ඇතිව නව සවිස්තරාත්මක තොරතුරු පද්ධතියක් 2022 දෙසැම්බර් සිට ක්‍රියාත්මක කර ඇත. වාර්තාවේ සඳහන් එම අවශ්‍යතාවය 2023 සිට ලබා ගත හැක. | අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා වාරික එකතු කිරීම සහ හිමිකම් සැකසීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් සහතික කිරීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ.) හිඟ ප්‍රතිරක්ශණ ගෙවීම් පිළිබඳ මූල්‍ය තොරතුරු රු. 2,623,829,593 සහ ගෙවා ඇති ප්‍රතිරක්‍ෂණ හිමිකම් පැතුරුම් පත්‍රවල අතින් නඩත්තු කර ඇත. එබැවින් ප්‍රතිරක්‍ෂණ අංශයේ ගනුදෙනු හැසිරවීමට හා වාර්තා තබා ගැනීමට නිසි ක්‍රමවේදයක් නොතිබූ බව නිරීක්ෂණය වේ. එබැවින්, ප්‍රතිරක්‍ෂණ අංශයේ මූල්‍ය තොරතුරු වාර්තා කිරීමේ දුර්වලතා හේතුවෙන් දත්තවල විශ්වාසනීයත්වය පිළිබඳ වැඩි අවදානමක් පවතී. තවද, ප්‍රතිරක්‍ෂණ හිමිකම් කාලීනව එකතු කිරීම සහ එම තොරතුරුවල නිරවද්‍යතාවය ගැටළු සහගත වේ. | පද්ධතියක් නොමැති වුවද, දත්තවල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය සහතික කිරීම සඳහා සාමාන්‍ය පාලනයන් ඇත. හිමිකම් ක්‍රියාවලි සඳහා ගිණුම්කරණ පද්ධතියෙහි ගෙවිය යුතු ගිණුම් මොඩියුලය දැනට ක්‍රියාත්මක වේ. තවද, 2022-2025 ආයතනික සැලැස්මට අනුව ප්‍රතිරක්ශණ අංශයේ හිමිකම් හැසිරවීම සඳහා ක්‍රමවේදයක් සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය මේ වන විට සිදු කරමින් පවතී. | ඵලදායී වාර්තාකරණ පද්ධතියක් ක්‍රියාත්මක වන බවට කළමනාකාරිත්වය සහතික විය යුතුය |

| | | |
|---|---|---|
| (ඊ) සේවක ණය ලේඛනයක් ආයතනය විසින් පිළිගත හැකි ආකාරයෙන් පවත්වාගෙන ගොස් නොතිබුණි. ඒ වෙනුවට, පැතුරුම්පත් ගොනුවක කාර්ය මණ්ඩල ණය ලේඛනයක් සකස් කර ඇති අතර, අනවසර වෙනස්කම් සිදුකල හැකි වීම, අතීත තොරතුරු මකා දැමීමට ඇති හැකියාව සහ අතීත තොරතුරු මකා දැමීම් හා වෙනස් කිරීම් පිළිබඳ වාර්තා වූ සිද්ධීන් සහ අතීත තොරතුරු වල නිවැරදි බව තහවුරු කළ නොහැකි වීම හේතුවෙන් දත්ත වල විශ්වාසනීයත්වය පහළ මට්ටමක පැවතුණි. මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2021 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල ණය මුළු ශේෂය රු. 47,326,145 කි. | කළමනාකාරිත්වය විසින් පිළිතුරු ලබා දී නොමැත. | කාර්ය මණ්ඩල ණය ලේඛනය අතින් හෝ විද්‍යුත් වශයෙන් පිළිගත හැකි ආකාරයෙන් පවත්වාගෙන යාමට කළමනාකාරීත්ය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (උ.) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය මගින් හඳුන්වා දුන් රාජ්‍ය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි (SOEs) මාර්ගෝපදේශ 2.3 අනුව, සියලුම රාජ්‍ය ව්‍යවසායන් සියලුම ප්‍රධාන මෙහෙයුම් ආවරණය වන පරිදි සිය පද්ධති, ක්‍රියාවලි සහ ක්‍රියාපටිපාටීන් පැහැදිලිව අර්ථ දක්වා වරින් වර සමාලෝචනය කර යාවත්කාලීන කර තිබිය යුතුය. නමුත්, අරමුදල සඳහා අනුමත තොරතුරු තාක්ෂණ සහ තොරතුරු පද්ධති ප්‍රතිපත්තියක් නොතිබුණි. එමනිසා, තොරතුරු තාක්ෂණ ආරක්ෂණ ප්‍රතිපත්තියක්, වාර්තා කළමනාකරණ ප්‍රතිපත්තියක්, ව්‍යාපාර අඛණ්ඩ කළමනාකරණය සහ ආපදා ප්‍රතිසාධන සැලැස්ම, කඩකිරීම් ප්‍රතිචාර සැලැස්ම සහ රහස්‍යතා ප්‍රතිපත්තියක් අරමුදල සඳහා නොතිබුණි. එබැවින්, මෙය දත්ත සහ සැකසූ තොරතුරු වල වලංගුභාවය, සම්පූර්ණත්වය, අඛණ්ඩතාව, ආරක්ෂාව සහ ලබා ගැනීමේ හැකියාව කෙරෙහි බලපානු ඇත. | කළමනාකාරිත්වය විසින් පිළිතුරු ලබා දී නොමැත. | අනුමත තොරතුරු තාක්ෂණ සහ තොරතුරු පද්ධති ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට කළමනාකරණය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| **අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ.) ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 07 – මූල්‍ය උපකරණ: හෙළිදරව් කිරීම<br>(i.) ප්‍රමිතියේ 33(අ) ඡේදය අනුව ප්‍රතිරක්ෂණ ලැබිය යුතු, මෝටර් රක්ෂණ ලැබිය යුතු සහ මෝටර් නොවන රක්ෂණ ලැබිය යුතු ගිණුම් | නිරීක්ෂණය සමග එකඟ වේ. | කළමනාකාරිත්වය ප්‍රමිතිය අනුව අවශ්‍ය හෙළිදරව් කිරීම් කළ යුතුය. |

| | | |
|---|---|---|
| සම්බන්ධයෙන් අවදානම් වලට නිරාවරණය හා එම අවදානම් පැනනගින ආකාරය පිළිබඳව අවශ්‍ය හෙළිදරව් කිරීම් ආයතනය විසින් සිදු කර නොතිබුණි.<br><br>(ii.) ප්‍රමිතියේ 33(ආ) ඡේදයට අනුව, ආයතනය අවදානම් කළමනාකරණය සඳහා වන අරමුණු, ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන් සහ ප්‍රතිරක්ෂණ ලැබිය යුතු මුදල්, මෝටර් රක්ෂණ වාරික සහ මෝටර් නොවන ලැබිය යුතු රක්ෂණ වාරික සම්බන්ධයෙන් අවදානම මැනීමට භාවිතා කරන ක්‍රම සම්බන්ධයෙන් ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් කර නොතිබුණි. | | |
| **(ආ.)** ශ්‍රී.ලං.ගි.ප්‍ර 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්කම් සහ වැරදි<br><br>ප්‍රමිතියේ 42 වැනි ඡේදය අනුව**,** ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි ආයතනයක් විසින් ඒවා සොයා ගැනීමෙන් පසු නිකුත් කිරීම සඳහා අවසර ලබා දී ඇති පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ නිවැරදි කළ යුතුය. ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමයේ **(**NNDIS) 2018 මැයි 26 සිට 2018 ජූලි 31 දක්වා කාලය සඳහා ගැලපුම් වාරිකය රු**.**123,387,679 සහ 2018 මාර්තු 15 සිට 2019 සැප්තැම්බර් 15 දක්වා කාලය සඳහා ප්‍රතිරක්ෂණ සැසියේ ගැලපුම් වාරිකය 466,292,684 සමාලෝචිත වර්ෂය සඳහා හඳුනාගෙන ඇත. එබැවින් මෙම වරද ප්‍රමිතියේ විධිවිධාන අනුව නිවැරදි කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස වසරේ ලාභය රු. 589,680,363 කින් අවතක්සේරු වී ඇත. | මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම සඳහා ගිණුම්කරණ දෝෂයක් නොමැත. | කළමනාකාරිත්වය විසින් මූල්‍ය ප්‍රකාශනවල ඇති ප්‍රමාණාත්මක, පූර්ව කාලපරිච්ඡේද දෝෂ අතීතයට බලපාන පරිදි ගැළපිය යුතුය. |
| (ඇ.) ශ්‍රී.ලං.ගි.ප්‍ර 12 - ආදායම් බදු<br>විලම්බිත බදු හඳුනාගැනීම සහ මැනීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. තවද**,** අරමුදල විසින් 2021 දෙසැම්බර් 31 දිනට විලම්බිත බදු වත්කම රු. 4,081,840 හඳුනාගෙන නොතිබුණි. | නිරීක්ෂණ සමග එකඟ වේ. විලම්භීත බදු ගණනය කිරීම් සිදු කර ඉදිරි වාර්තාකරණයේදී හෙළිදරව් කරනු ඇත. | විලම්භිත බදුකරණය ගිණුම් තැබීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ.) ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 4 - රක්ෂණ ගිවිසුම් ප්‍රමිතයේ 36 සහ 37(a) ඡේද අනුව, | 2022 වර්ශයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපත්තිය හෙළිදරව් කර ඇත. | මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිරක්ෂණ දළ ලිඛිත වාරික ආදායම හඳුනා ගැනීම |

| | | |
|---|---|---|
| රක්ෂණකරුවෙකු විසින් රක්ෂණ ගිවිසුම් වලින් පැන නගින වටිනාකම් තම මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන හෙළිදරව් කළ යුතුය.. කෙසේ වෙතත්, ආයතනය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිරක්ෂණ දළ ලිඛිත වාරික ආදායම හඳුනා ගැනීම සහ මැනීම සඳහා භාවිතාකල ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනාවරණය කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා හඳුනාගත් ප්‍රතිරක්ෂණ දළ ලිඛිත වාරික ආදායම රු. 3,548,784,649 කි. | | සහ මැනීම සඳහා අදාල ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කිරීමට කළමනාකරණය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ.) ශ්‍රී.ලං.ගි.ප්‍ර 08 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්වීම් සහ වැරදි ප්‍රමිතයෙහි 13 වන ඡේදය අනුව, ආයතනය සමාන ගනුදෙනු සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගෙන ඒවා සංගතව යොදා ගත යුතුය.. කෙසේ වෙතත්, භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර තක්සේරු කිරීම සඳහා අරමුදල විවිධ ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර තිබුණි අරමුදල 2019 දී භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර අගය කිරීම සඳහා සාමාන්‍ය ඉපයුම භාවිතා කර ඇත. කෙසේ වෙතත්, 2020 සහ 2021 දී භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ගණනය කිරීම සඳහා මිලදී ගැනීමේ ඉපයුම භාවිතා කර ඇත. තවද, ආයෝජන ප්‍රතිපත්තිය තුළ භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර අගය කිරීමේ ක්‍රමය හඳුනාගෙන නොතිබුණි. | නිරීක්ෂණය සමග එකඟවේ. | කළමනාකරණය ස්ථාවර ගිණුම්කරණ ප්‍රතිපත්තියක් භාවිතා කරමින් බැඳුම්කර සහ භාණ්ඩාගාර බිල්පත් අගය කළ යුතුය. |

### 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ.) පොදු ලෙජර් පාලම ගිණුමට අනුව ප්‍රතිරක්ෂණ ලැබිය යුතු ශේෂයන් රු. 1,590,481,053 සහ විගණනයට ඉදිරිපත් කරන ලද ප්‍රතිරක්ෂණ ලැබිය යුතු වයස් විශ්ලේෂණ වාර්තාව අනුව එම ශේෂය රු. 1,581,447,299 කි. එබැවින්, ප්‍රතිරක්ෂණ ලැබිය යුතු පොදු ලෙජර් පාලන ගිණුම සහ ප්‍රතිරක්ෂණ ලැබිය යුතු වයස් විශ්ලේෂණය අතර රු. 9,033,754 ක වෙනසක් | ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයේ ස්වභාවය අනුව, සමූහ ප්‍රතිරක්ෂණ ගිවිසුම් අවසන් කර කාර්තුමය පදනමින් වාර්තා කරනු ලැබේ. එනම් කාර්තුවේ ගිණුම් අවසන් වී දින 45ක් හෝ දින 60ක් ඇතුළත ගිවිසුම් නියමයන් මත පදනම්ව පරීක්ෂා කිරීම සහ ඉන්වොයිසි කිරීමේ අරමුණ සඳහා ප්‍රතිරක්ෂණකරු (NITF) වෙත දැනුම් දෙනු ලැබේ. එබැවින්, සෑම | කළමනාකාරීත්වය කාලෝචිත ලෙස වෙනස්කම් හඳුනාගෙන එම වෙනස්කම් නිවැරදි කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| නිරීක්ෂණය විය. අරමුදල විසින් සකස් කරන ලද සැසඳුම් ප්‍රකාශය අනුව, මෙම වෙනස නියෝජනය කරන්නේ වයස් විශ්ලේෂණයෙන් රක්ෂණ සමාගමකින් ලැබිය යුතු රු. 9,053,364 ක ශේෂයක් මගහැරීම සහ තවදුරටත් හඳුනා නොගත් රු.19,610 ක වෙනසක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, හඳුනාගත් රු. 9,053,364 ක අතපසුවීම් සඳහා කිසියම් ගැලපීමක් ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අවශ්‍ය වේද යන්න තීරණය කිරීමට විගණනය සඳහා සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. | ප්‍රතිරක්ෂණකරුවෙකුම, ව්‍යාපාරයේ ඉන්වොයිස් කිරීම සඳහා කඩඉමක් පවත්වාගෙන යයි. සාමාන්‍යයෙන්, කඩඉම් සෑම වසරකම තුන්වන කාර්තුවේදී සකසා ඇත. එබැවින් RI වාරික ආදායම හඳුනාගැනීමේ පරිචය වන්නේ පසුගිය මූල්‍ය වර්ෂයේ අවසාන කාර්තුවේ සහ වත්මන් මූල්‍ය වර්ෂයේ පළමු කාර්තු තුනේ වාරික ආදායම ලබා ගැනීමයි. එබැවින්, අරමුදලේ සියලුම ගිවිසුම් විධිවිධාන සෑම වසරකම සැප්තැම්බර් 30 වන දිනට සලකා බලමින් ඉන්වොයිස් කරනු ලැබේ. ප්‍රතිරක්ෂණ ව්‍යාපාරික පන්තිය සඳහා ප්‍රතිරක්‍ෂණ වසර පදනම් කරගෙන දළ ලිඛිත වාරික ආදායම හඳුනාගැනීමේ යෝජිත ක්‍රමය යෙදිය නොහැකි බව කරුණාවෙන් සලකන්න. | |
| (ආ.) මූල්‍ය ප්‍රකාශන සහ විගණනය සඳහා ඉදිරිපත් කරන ලද විස්තරාත්මක උපලේඛනය අනුව කාර්ය මණ්ඩල ණය ශේෂය අතර රු. 568,087 ක් වෙනසක් නිරීක්ෂණය විය. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. | කළමනාකාරිත්වය විසින් මූල්‍ය වාර්තාවල පවතින වෙනස්කම් හඳුනාගෙන එම වාර්තා කාලීනව නිවැරදි කළ යුතුය. |
| (ඇ.) 2020 වසර සඳහා වන රු. 3,445,057 ක පරිපාලන වියදම් 2021 වර්ෂයේදී ගිණුම්ගත කර ඇත. තවද, 2021 වර්ෂයට අදාළ පරිපාලන වියදම් රු. 2,280,680 ක් 2022 වර්ෂයේදී ගිණුම්ගත කර ඇත. එබැවින් ප්‍රවර්තන වර්ෂය සඳහා වූ මුළු වියදම් රු. 1,164,377 කින් වැඩිපුර පෙන්නුම් කර ඇති අතර ප්‍රවර්තන වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අවප්‍රමාණය වී ඇත. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. | නිවැරදි ගිණුම්කරණ කාලසීමාව සඳහා වියදම් හඳුනා ගැනීම සහ උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා සුදුසු ක්‍රියාවලියක් පවතින බව කළමනාකාරිත්වය සහතික කළ යුතුය. |
| (ඈ.) 2020 සංශෝධිත මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාගම ප්‍රතිරක්ෂණය සඳහා ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්තියක් හඳුන්වා දී ඇත. නමුත් ශ්‍රී.ලං.ගි.ප්‍ර 08 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්වීම් සහ වැරදි ප්‍රමිතයෙහි හි 13 වන ඡේදය අනුව සමාලෝචිත වර්ෂය සඳහා එම ප්‍රතිපත්තිය අඛණ්ඩව අනාවරණය කර නොතිබුණි. 2020 වර්ෂය සඳහා සංශෝධිත මූල්‍ය ප්‍රකාශනවල | අරමුදල ප්‍රතිරක්ෂණ සඳහා ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්තිය හෙළි නොකළද, එයින් අදහස් වන්නේ එකම ප්‍රතිපත්තියම අඛණ්ඩව යෙදී නොමැති බව නොවේ, 2020 සහ 2021 යන වර්ෂ දෙක සඳහා අරමුදල ප්‍රතිරක්‍ෂණය සඳහා එකම ප්‍රතිපත්තියම යොදවා ඇත. තවදුරටත්, අරමුදල අධි ගණනය වශයෙන් සඳහන් කර ඇති රු. 39,179,361 ක වටිනාකම සමග එකඟ නොවේ. 2020 දී හෙළිදරව් කරන ලද ප්‍රතිරක්ෂණ වාරික හඳුනාගැනීමේ | කළමනාකරණය විසින් අදාළ වාර්තාකරණ රාමුව මත පදනම්ව ආදායම් හඳුනාගැනීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය සකස් කළ යුතු අතර ඒ අනුව ආදායම හඳුනාගත යුතුය. |

| | | |
|---|---|---|
| හෙළිදරව් කර ඇති ප්‍රතිපත්තියට අනුව, ප්‍රතිරක්ෂණ නායක තහවුරු කිරීමත් සමඟ වරින් වර ලැබෙන උපදෙස් අනුව සමානුපාතික ගිවිසුම් ප්‍රති-රක්ෂණ වාරිකය හඳුනාගනු ලැබේ. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා 2021 ට පෙර රු. 723,971,289 ක ප්‍රති රක්ෂණ වාරික හඳුනාගෙන ඇති බව නිරීක්ෂණය විය. තවද ප්‍රතිරක්ෂණ නායක තහවුරු කිරීම් සහ කාලීන නිවේදන ප්‍රමාද වී ලැබීම හේතුවෙන් ප්‍රවර්තන කාලපරිච්ඡේදයට අදාල ප්‍රති-රක්ෂණ වාරික රු.684,791,928 ක් 2022 වසර සඳහා හඳුනාගෙන තිබුණි. මේ හේතුවෙන් වසරේ ආදායම රුපියල් 39,179,361 කින් අධි ගණනය වී තිබුණි. | ප්‍රතිපත්තිය අනුව, ප්‍රමුඛ තහවුරු කිරීමත් සමඟ ප්‍රතිරක්ෂිතයින් වෙතින් වරින් වර ලැබෙන උපදෙස් මත අභ්‍යන්තර සමානුපාතික ප්‍රතිරක්ෂණ ගිවිසුම් වාරික හඳුනා ගැනේ. | |
| (ඉ.) 2020 වර්ෂය සඳහා සංශෝධිත මූල්‍ය ප්‍රකාශන මගින් හඳුන්වා දුන් ගිණුම් ප්‍රතිපත්තියට අනුව, ගිවිසුම ආරම්භයේදී දැනටමත් ස්ථාපිත කර ඇති ගිවිසුම් වාරිකය මත පදනම්ව සමානුපාතික නොවන ප්‍රති-රක්ෂණ ගිවිසුම් සඳහා ප්‍රති-රක්ෂණ දළ ලිඛිත වාරිකය හඳුනාගෙන ඇත. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා 2021 ට පෙර ප්‍රති රක්ෂණ වාරික රු. 35,138,723 ක් හඳුනාගෙන ඇති බව නිරීක්ෂණය විය. තවදුරටත් ප්‍රවර්තන වර්ෂය සඳහා අදාළ රු.15,800,799 ක ප්‍රති-රක්ෂණ වාරික 2022 වර්ෂයේ දී හඳුනාගෙන ඇත. කාල සීමාව අවසානයේ පවතින අතිරේක තොරතුරු සහ යාවත්කාලීන තොරතුරු සමඟ ගිවිසුම් සමාලෝචනය කර අදාළ ගැලපීම් සිදු නොකිරීම නිසා මෙය සිදු විය. මේ නිසා වසරේ ආදායම රු. 19,337,924 කින් අධි ගණනය වී ඇත. | අරමුදල නිරීක්ෂණය සමඟ එකඟ වේ. | කළමනාකරණය විසින් අදාළ වාර්තාකරණ රාමුව මත පදනම්ව ආදායම් හඳුනාගැනීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය සකස් කළ යුතු අතර ඒ අනුව ආදායම හඳුනාගත යුතුය. |
| (ඊ.) පීය ප්‍රති-රක්ෂණ ගිවිසුම් (Facultative Re-insurance Agreement) සඳහා වන ගිණුම් ප්‍රතිපත්තිය අනුව ප්‍රමුඛ ප්‍රතිරක්ෂක තහවුරු කිරීම ලැබීමෙන් පසු රක්ෂණ වාරිකය හඳුනාගෙන ඇත. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා පූර්ව කාලපරිච්ඡේද සඳහා අදාළ රු. 143,783,983 ක ප්‍රති රක්ෂණ වාරික හඳුනාගෙන ඇත. තවද, ප්‍රවර්තන | අරමුදල අඩුවෙන් දක්වා ඇති බව සඳහන් රු. 26, 281,949 වටිනාකම සමඟ එකඟ නොවේ. 2020 දී අනාවරණය කරන ලද ප්‍රතිරක්ෂණ වාරික හඳුනාගැනීමේ ප්‍රතිපත්තියට අනුව, නායක තහවුරු කිරීම ලැබීමෙන් පසු අදාළ මූල්‍ය කාල සීමාව තුළ උපකල්පනය කරන ලද පීය අවදානම් සම්බන්ධයෙන් මූල්‍ය වර්ෂය තුළ අභ්‍යන්තර පීය ප්‍රතිරක්ෂණ වාරික | කළමනාකරණය විසින් අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූලව ආදායම හඳුනාගත යුතුය. |

| | | |
|---|---|---|
| කාලසීමාව සඳහා අදාල ප්‍රතිරක්ෂණ වාරික ආදායම් රු. 170,065,932 2022 වර්ෂයේදී හඳුනාගෙන ඇත. මේ හේතුවෙන් වර්ෂය සඳහා ආදායම රු. 26,281,949 කින් අවප්‍රමානය වී ඇත. | හඳුනාගෙන ඇත. ඒ අනුව, ප්‍රතිපත්ති ප්‍රකාරව තහවුරු කිරීම ලැබීමෙන් පසු පිය රක්ෂණ වාරිකය හඳුනාගෙන ඇත. | |
| (ඉ.) 2022 මැයි 19 වැනි දින විගණන දිනට බැංකු ගිණුම් හතරක (04) ක මාස නවය (09) කට අදාළව බැංකු සැසඳුම් ප්‍රකාශයට අමුණා ඇති මුදල් පොතේ ශේෂය හා ගිණුම් පද්ධතිය අනුව මුදල් පොතේ ශේෂය අතර රු. 3,408,464 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම වෙනස්කම් මුදල් පොත් ගිණුම් පද්ධතියේ පවත්වාගෙන යන බැංකු ගිණුම් හතරක විය හැකි අතර අනෙකුත් බැංකු ගිණුම් වෙනම පද්ධතියක පවත්වාගෙන යයි. මුදල් පොත් ගිණුම් පද්ධතියේ බැංකු සැසඳුම් වලට පසුකාලීනව වෙනස්කම් සිදු කිරීම මේ සඳහා හේතු විය හැකිය. | කළමනාකාරීත්වය විසින් කාලෝචිත ලෙස වෙනස්කම් හඳුනාගෙන එම වෙනස්කම් නිවැරදි කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඊ.) භාවිත අයිතිය රුපියල් 5,351,298 ක් වූ වත්කම්, භාවිත අයිතිය වත්කම මත කල්බදු වගකීම් රු. 7,339,958 ක් සහ භාවිත අයිතිය වත්කම්වල මූල්‍ය පිරිවැය රු. 2,259,970 ක් සමාලෝචිත වර්ෂය සඳහා වැඩිපුර දක්වා තිබුණි. | අරමුදල විසින් 2022 වර්ෂයේදී මෙම දෝෂය හඳුනාගෙන ඇති අතර අදාළ ගැලපීම් 2022 වර්ෂයේදී සිදු කරන ලදී. | ගිණුම්කරණ අඩුපාඩු කාලෝචිත ලෙස නිවැරදි කිරීමට කළමනාකාරිත්වය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| අයිතමය | ප්‍රමාණය (රු) | සාක්ෂි නොමැත | කළමනාකරණ අදහස | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ.) ලැබිය යුතු ආදායම් බදු | 22,465,243 | බදු ගණනය කිරීම සහ තහවුරු කිරීම් | SRCC අරමුදල සහ මණ්ඩලය සඳහා වෙන වෙනම පොදු ලේඛන දෙකක් පවත්වාගෙන යයි. කෙසේ වෙතත්, මණ්ඩලය සතුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ එක් බදු ලියාපදිංචි අංකයක් තිබේ.. වටිනාකම රු. 22,465,243ක් වන ආර්ථික සේවා ගාස්තුව පෙර වර්ෂයේ බදු බැර ලෙස ඉල්ලා ඇත. SRCC අරමුදලේ බදු ලාභය හේතුවෙන් ආදායම් බදු වගකීම පැන නැඟී ඇති අතර ආර්ථික සේවා ගාස්තුව මණ්ඩලය විසින් ගෙවා ඇත. එබැවින්, එක් පොදු ලෙජරයක මෙම හිමිකම් මුදල ගෙවිය යුතු බදු (ඍණ) ශේෂයක් ලෙස දිස්වේ. | ඵලදායි විගණනයක් ක්‍රියාත්මක කිරීම සඳහා කලමනාකාරීත්වය විසින් තොරතුරු නියමිත වේලාවට ලබා දීම සහතික කළ යුතුය. |
| (ආ.) - ලැබිය යුතු කුලී තැන්පතු | 2,180,969 | ගෙවීම් වවුචරය සහ ගිවිසුම | ඉතිරි කුලී තැන්පතු මුදල දුම්රිය දෙපාර්තමේන්තුව විසින් සපයන ලද ගබඩාවට අදාළ වේ. ඔබගේ සත්‍යාපනය සඳහා සියලුම මූලාශ්‍ර | |

| | | | |
|---|---|---|---|
| - ආපසු ගෙවිය යුතු තැන්පතු | 892,693 | කුවිතාන්සිය සහ ගිවිසුම | ලේඛන තිබේ. |
| (ඈ.) - දිගුකාලීන හිඟ ගෙවිය යුතු ශේෂයන් | 282,865,828 | කුවිතාන්සි සහ ගිවිසුම් | මෙම නිරීක්ෂණයට ප්‍රතිචාර දැක්වීමට මණ්ඩලයට වඩාත් සවිස්තරාත්මක තොරතුරු අවශ්‍ය වේ. |
| (ඇ.) - ගෙවීම් වවුචර | 2,490,462 | උපකාරක ලියකියවිලි සහිත ගෙවීම් වවුචර | සත්‍යාපනය සඳහා සියලුම ගෙවීම් වවුචර ඉදිරිපත් කළ හැකිය. |
| (ඉ.) ජර්නල් වවුචර් | 2,584,778,761 | උපකාරක ලියකියවිලි සමඟ ජර්නල් වවුචර | අදාළ මූලාශ්‍ර ලේඛන සහිතව සියලුම ජර්නල් වවුචර සත්‍යාපනය සඳහා ඉදිරිපත් කළ හැක. |
| (ඊ.) ගංවතුර සහ ගංවතුර නොවන ප්‍රතිරක්‍ෂණ හිමිකම් සඳහා ගෙවීම් | 1,298,922,574. | ගෙවීම් සඳහා උපකාරක ලියකියවිලි සමඟ සවිස්තරාත්මක උපලේඛන | 2021 වර්ෂය සඳහා ගංවතුර සහ ගංවතුර නොවන අවස්ථාවලදී ගෙවන ලද ප්‍රතිරක්‍ෂණ හිමිකම් සම්බන්ධ තොරතුරු සත්‍යාපනය සඳහා ඉදිරිපත් කළ හැක.. |
| (උ.) ප්‍රතිරක්‍ෂණ හිඟ හිමිකම් ප්‍රතිපාදන | 2,341,883,754 | තෙවන පාර්ශවීය තහවුරු කිරීම්, දැනුම්දීම්, සැසඳීම්, හිමිකම් පියවීම් ඔපනයක සහ කළමනාකරණ අදහස් දැක්වීම්. | ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ හිමිකම් සඳහා තෙවන පාර්ශව තහවුරු කිරීම් ලබා ගැනීමට අරමුදල දැනටමත් ඊමේල් යවා ඇත. කෙසේ වෙතත්, අපේක්ෂිත සියලුම තහවුරු කිරීම් ලැබෙමින් පවතින අතර අරමුදල එම තහවුරු කිරීම් ලබා ගත් වහාම විගණනය වෙත යොමු කරනු ලැබේ. |
| (ඌ.) ලැබිය යුතු අභ්‍යන්තර ප්‍රතිරක්ෂණ වාරික | 1,457,619,423 | තෙවන පාර්ශවීය තහවුරු කිරීම්, ඉන්වොයිසි, රිසිට්පත්, සැසඳීම් , අයකිරීම් උපලේඛන, වයස් විශ්ලේෂණය සහ කළමනාකරණ අදහස් | ප්‍රතිරක්ෂණ වාරික ලැබිය යුතු මුදල් සඳහා තෙවන පාර්ශව තහවුරු කිරීම් ලබා ගැනීමට අරමුදල දැනටමත් ඊමේල් යවා ඇත. කෙසේ වෙතත්, අපේක්ෂිත සියලුම තහවුරු කිරීම් ලැබෙමින් පවතින අතර අරමුදල වෙත එම තහවුරු කිරීම් ලැබුණු වහාම විගණනය වෙත යොමු කරනු ලැබේ. කෙසේ වෙතත්, විගණන නිලධාරීන් විසින් කලින් සිදු කරන ලද පරිදි සත්‍යාපනය සඳහා විකල්ප ක්‍රියා පටිපාටි සිදු කළ හැක. |
| (එ.) රෙට්රෝ සහ ස්වභාවික ආපදා ප්‍රතිරක්ෂණ ලැබිය යුතු මුදල් | 1,102,142,174 | වයස් විශ්ලේෂණය | අරමුදල ඉදිරියේදී වටිනාකම් ඉදිරිපත් කරනු ඇත. |

## 1.6 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර එකකට වැඩි කාලයක් හිඟව පවතින ලැබිය යුතු ප්‍රතිරක්‍ෂණ වාරික රු.149,602,423 ක් වන අතර එය ලැබිය යුතු මුළු ප්‍රතිරක්‍ෂණ වාරිකයෙන් 9% ක් නියෝජනය කරන අතර වසර දෙකකට වැඩි කාලයක් හිඟව පවතින ලැබිය යුතු ප්‍රතිරක්‍ෂණ වාරික රු.104,522,202 ක් වන අතර එය ලැබිය යුතු මුළු ප්‍රතිරක්‍ෂණ වාරිකයෙන් 7% ක් නියෝජනය කරයි. වසර තුනකට වැඩි කාලයක් හිඟව පවතින ලැබිය යුතු ප්‍රතිරක්‍ෂණ වාරික රු. 290,717,054 ක් වන අතර එය ලැබිය යුතු මුළු ප්‍රතිරක්‍ෂණ වාරිකයෙන් 18% ක් නියෝජනය කරයි. ඒ අනුව, ආයතනය දිගුකාලීනව හිඟව පවතින ප්‍රතිරක්ෂණ ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. | අරමුදල මාසිකව රක්ෂණ සමාගම් වෙත සිහිකැඳවීම යවනු ලබයි. | හිඟ ශේෂයන් අයකර ගැනීමට කළමනාකාරීත්වය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ.) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 7, 31(2) සහ 49 (ආ) වගන්ති | සකස් කරන ලද රීති ප්‍රකාරව තොරතුරු ඇතුළත් කාර්තුමය වාර්තා 4ක් රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත යැවිය යුතුය.. කෙසේ වෙතත්, රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත දින 17 සිට 362 දක්වා ප්‍රමාදයක් සහිතව එම කාර්තුමය වාර්තා ඉදිරිපත් කර තිබුණි. | වසරක් සඳහා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත කාර්තුමය වාර්තා 04 ක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.. පළමු, දෙවන, තෙවන සහ සිව්වන කාර්තුමය වාර්තාව පිළිවෙළින් දින 23,32,46 සහ 17 ප්‍රමාදයක් සහිතව ඉදිරිපත් කරන ලදි. කෙසේ වෙතත්, නියමිත ඉදිරිපත් කිරීමේ දිනට දින දෙකකට පෙර එනම් 2022 අප්‍රේල් 28 දින වාර්ෂික වාර්තා ඉදිරිපත් කර ඇත. මෙම සියලු ප්‍රමාදයන් සිදු වූයේ සංචාරක සීමා කිරීම්, රට වසා දැමීම, කාර්ය මණ්ඩල වෛරසයට ගොදුරු වීම වැනි කොවිඩ් 19 වසංගත බලපෑම් හේතුවෙනි. | නියාමන වාර්තා ඉදිරිපත් කිරීමේදී අනාගතයේදී සිදු විය හැකි ප්‍රමාදයන් වළක්වා ගැනීමට කළමනාකාරීත්වය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ.) 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතේ 6(1)(ඉ) වගන්තිය | පනතේ විධිවිධානවලට අනුව, මූල්‍ය, බැංකු, රක්ෂණ, කළමනාකරණ හෝ නීති යන ක්ෂේත්‍රවල සුදුසුකම් හෝ ප්‍රවීණත්වය | 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතේ 6.1 වගන්තියට අනුව, අරමුදලේ මණ්ඩලය සභාපතිවරයා ඇතුළු | කළමනාකාරීත්වය පනතේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඇති පුද්ගලයන් අතරින් අමාත්‍යවරයා විසින් පුද්ගලයන් තිදෙනෙකු (03) අරමුදලේ මණ්ඩලයට නම් කළ යුතුය. නමුත්, 2021 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩල තනතුරු දෙකක් (02) තවමත් පුරප්පාඩු වී ඇති බව නිරීක්ෂණය විය. | සාමාජිකයින් හත් දෙනෙකුගෙන් සමන්විත වේ. ඒ අනුව, 2022 නොවැම්බර් 16 වන දින පනතේ 6 (1) (ඉ) වගන්තිය අනුව පුරප්පාඩු වූ තනතුරු දෙකක් අමාත්‍යවරයා විසින් පුරවන ලදී. එබැවින්, 2022 නොවැම්බර් 16 දින සිට, අරමුදලේ මණ්ඩලයේ සංයුතිය සම්පූර්ණ වේ. | |
| (ඇ.) 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතේ 13(ඉ) වගන්තිය | පනතේ විධිවිධානවලට අනුව අරමුදල සම්බන්ධයෙන් සාමාන්‍ය ගිණුමක් සහ එක් එක් සාමාජිකයා සම්බන්ධයෙන් වෙන වෙනම තනි ගිණුම් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, අරමුදල විසින් තනි සාමාජිකයින් සඳහා වෙනම ගිණුම් පවත්වාගෙන ගොස් නොතිබුණි. | තනි පුද්ගල ගිණුම් විස්තර තොරතුරු පද්ධතිය තුළ පවත්වාගෙන යනු ලැබේ; සේවාලාභීන්ගේ ජාතික හැඳුනුම් හැඳුනුම්පත් අංක භාවිතයෙන් ඒවාට ප්‍රවේශ විය හැක. | අරමුදල පනතේ අදාළ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ.) 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතේ 23 වැනි වගන්තිය | පනතේ විධිවිධානවලට අනුකූලව, රක්ෂණ සමාගම් විසින් අරමුදලට උපචිත මුදල නිවැරදිව ඉන්වොයිස් කර ප්‍රේෂණය කර තිබේද යන්න තහවුරු කර ගැනීම සඳහා රක්ෂණ සමාගම්වල වාර්තා පරීක්ෂා කිරීමට අරමුදල අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අරමුදල නිරීක්ෂණයට එකඟ විය. සාමාන්‍යයෙන්, අභ්‍යන්තර විගණන අංශය රක්ෂණ සමාගම්වල ආදායම් සත්‍යාපනය සිදු කරයි. කෙසේ වෙතත්, කෝවිඩ් වසංගතය හේතුවෙන්, එම පරික්ෂා කිරීම් ක්‍රියාත්මක නොවීය. | අරමුදල පනතේ අදාළ විධිවිධානවලට අනුකූල විය යුතු අතර සම්පූර්ණ හා කාලෝචිත ලෙස ආදායම් එකතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ.) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) ඡේදය | ආයතනයේ පාලක මණ්ඩලය අරමුදල සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කළ යුතුය. කෙසේ වෙතත්, 2020 පෙබරවාරි සිට 2021 ඔක්තෝබර් දක්වා කාලය තුළ අභ්‍යන්තර විගණන කාර්යය සිදු කර නොතිබුණි. | රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ලබා දී ඇති උපදෙස් අනුව, අභ්‍යන්තර විගණකවරයකු නැවත පත් කළ යුතුය. එබැවින් අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු විය. කෙසේ වෙතත්, අංශයේ කාර්යය දිගටම කරගෙන යමින් පැවතුණි. අංශයක තනතුරක් පුරප්පාඩු බීම යනු එහි කාර්යයන් අත්හිටුවීම නොවේ. | අභ්‍යන්තර විගණනයේ ඵලදායී ක්‍රියාකාරිත්වය කළමනාකරණය විසින් සහතික කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ.) මු. රෙ. 386(7) | අවලංගු කරන ලද චෙක්පත්, චෙක් පිළිපතේ අමුණා තිබිය යුතු වුවද, අරමුදල විසින් ගෙවීම් වවුචරය සමඟ අවලංගු කරන ලද චෙක්පත් අමුණා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වවුචරය අස්ථානගත වීමකදී අවලංගු කරන ලද චෙක්පත් සම්බන්ධ සියලු තොරතුරුද නැතිවී යා හැක. | අරමුදල මුද්‍රණ කටයුතු සඳහා අඛණ්ඩ චෙක්පත් රෝල් භාවිතා කරන බැවින් (චෙක්පත් අතින් ලියන ලද ඒවා නොවන බැවින්) චෙක් පිළිපත් වෙන වෙනම ගොනු කිරීම ප්‍රායෝගිකව කළ නොහැක. එබැවින්, ගෙවීම් වවුචරය සමඟ චෙක් පිළිපත් අමුණා ගොනු කර ඇත. වවුචරයේ කිසියම් අස්ථානගතවීමක් සිදුවුවහොත්, ගිණුම්කරණ පද්ධතිය තුළින් සියලුම විස්තර ලබා ගත හැකි අතර එහි පළ කිරීමෙන් පසු වවුචර විස්තර වෙනස් කළ නොහැක. කෙසේ වෙතත්, අවලංගු කරන ලද චෙක් පිළිපත් සමග ගොනු කර ඇත. | මූල්‍ය තොරතුරු සුරක්ෂිත කිරීම සඳහා කළමනාකරණය මූල්‍ය රෙගුලාසිවල අවශ්‍යතාවලට අනුකූල විය යුතුය. |
| (උ.) මු.රෙ. 395(ආ) | බැංකු සැසඳුම් ප්‍රකාශ අදාළ ගෙවීම් නිලධාරියා විසින් සහතික කළ යුතු අතර, ඒවා පරීක්ෂා කිරීම සඳහා විගණනයට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, බැංකු ගිණුම් දහඅටක් (18) සඳහා සකස් කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශ නම, තනතුර සහ දිනය නොමැතිව සහතික කර තිබුණි. | මු. රෙ. 395(ආ) අනුව, "ආයතනයයේ මුදල් පොත අනුව ශේෂය එකඟ කිරීම සඳහා බැංකු ප්‍රකාශනයේ දැක්වෙන ශේෂය සමඟ බැංකු සැසඳුම් ප්‍රකාශයක් ලෙස හඳුන්වන ප්‍රකාශයක් සකස් කළ යුතුය. එය අදාළ ගෙවීම් නිලධාරියා විසින් සහතික කළ යුතු අතර, පරීක්ෂා කිරීම සඳහා විගණනයට ලබා දිය යුතුය" ඉහත වගන්තිය අනුව ගෙවන නිලධාරියා විසින් සියලු බැංකු සැසඳුම් සහතික කර ඇති බැවින් කිසිදු උල්ලංඝනයක් සිදු නොවේ. | කළමනාකරණය මූල්‍ය රෙගුලාසිවල අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඌ.) මු. රෙ. 446 | අනුක්‍රමික අංක අනුපිළිවෙල නොතිබීම සහ වෙනස් කිරීම් සඳහා බලයලත් අත්සන් නොමැති වීම හේතුවෙන් වැඩ වර්ජන, කැරලි කෝලාහල සිවිල් කලබල හා ත්‍රස්තවාදී අරමුදලේ සුළු මුදල් පොත නිසි ලෙස නඩත්තු කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. | කළමනාකරණය මුදල රෙගුලාසිවල අවශ්‍යතාවලට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ.) මු.රෙ.446(1)(c) | වැඩ වර්ජන කැරලි කෝලාහල සිවිල් කැලඹීම් සහ ත්‍රස්තවාදී අරමුදල කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මුදල් පොතේ සටහන් කාලීනව ලියා නොතිබූ අතර, දෛනික හෝ මාසික පදනමින් සම්පූර්ණ කර තුලනය කර නොතිබුණි තවද, වගකිවයුතු අධීක්ෂණ හෝ මාණ්ඩලික නිලධාරියෙකු බැංකු ගිණුම් තුනකට (03) අදාළ මුදල් පොත් අත්සන් කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. | කළමනාකරණය මුදල රෙගුලාසිවල අවශ්‍යතාවලට අනුකූල විය යුතුය. |
| (ඒ.) 2015 මැයි 25 දිනැති අංක PED 2/2015 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 04 වගන්තිය. | චක්‍රලේඛයේ විධිවිධාන අනුව ජංගම දුරකථන මිලදී ගැනීමේ පිරිවැය නිලධාරීන් විසින් පුද්ගලිකව දරා ගත යුතුය. කෙසේ වෙතත්, අරමුදල රු. 168,700 ක් වියදම් කර සේවකයින් සඳහා 2021 වසර සඳහා ජංගම දුරකථන මිලදී ගෙන තිබුණි. මේ ආකාරයට ජංගම දුරකථන මිලදී ගැනීම සඳහා අරමුදල විසින් 2016 සිට 2021 දක්වා රු. 2,601,071 ක පිරිවැයක් දරන ලදී.. | ව්‍යාපාරික අවශ්‍යතා සපුරාලීම සඳහා අරමුදලට නිල කාර්යයන් සඳහා සේවකයින්ට ජංගම දුරකථන මිලදී ගැනීමට සිදුවේ. ඊට අමතරව ඒවා අරමුදලේ වත්කම් ලෙස සටහන් කර කාර්ය මණ්ඩලයට භාවිතය සඳහා වෙන් කර ඇති අතර රැකියාවෙන් ඉල්ලා අස් වූ විට හෝ කාලසීමාව අවසානයේ දී වෙන් කළ එම ජංගම දුරකථනය අරමුදලට ආපසු ලබා දිය යුතුය. එබැවින් මෙය චක්‍රලේඛයේ සඳහන්ව ඇති පුද්ගලික ජංගම දුරකථන මිලදී ගැනීම ප්‍රතිපූරණයක් නොවේ. | කළමනාකාරීත්වය චක්‍රලේඛයේ අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඔ.) 2021 රාජ්‍ය ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 2.2.2(a)(ii) මාර්ගෝපදේශය | පනතේ විධිවිධානවලට අනුකූලව අවම වශයෙන් මසකට වරක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් නිතිපතා පැවැත්විය යුතුය. නමුත්, 2021 අප්‍රේල්, ජුනි, ජූලි, සැප්තැම්බර්, ඔක්තෝබර් සහ නොවැම්බර් මාස සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වා නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. පැවැති වසංගත තත්ත්වය හේතුවෙන් මෙය සිදු විය. | කළමනාකාරීත්වය යහපාලන අවශ්‍යතාවලට අනුකූල විය යුතුය. |
| (ඕ.) 2021 රාජ්‍ය ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ | මාර්ගෝපදේශය අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු පත් කිරීම සහ ඒවායේ නිසි ක්‍රියාකාරිත්වය | නිරීක්ෂණය සමඟ එකඟ වේ. පැවති වසංගත තත්ත්වය නිසා මෙය ප්‍රායෝගික නොවීය. තවද සමාලෝචනය කිරීමට නියමිත කාල සීමාව තුළ අදාළ | කළමනාකාරීත්වය යහපාලන අවශ්‍යතාවලට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| 2.2.2 (b) (xii) මාර්ගෝපදේශය | සහතික කළ යුතුය. කෙසේ වෙතත්, අවදානම් කමිටුව, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව වැනි අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක වී නොතිබුණි. | පාර්ශවීය ගනුදෙනු කිසිවක් සිදු නොවීය. | |
| (ක.) 2017 සංයුක්ත මනා පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ G.2 මූලධර්මය | මණ්ඩලය විසින් ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරියෙකු (CISO) පත් කර නොතිබීම හෝ ආයතනය සඳහා සයිබර් ආරක්ෂණ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සකස් කර නොතිබුණි. | වර්තමානයේ 2017 සංයුක්ත මනා පාලනය පිළිබඳ මාර්ගෝපදේශය ලැයිස්තුගත කර ඇති සමාගම් සහ අනෙකුත් විශාල සමාගම් විසින් බහුලව භාවිතා වේ. අරමුදල දැනට තොරතුරු තාක්ෂණ කළමනාකරුවකු පත් කර ඇත. | කළමනාකාරීත්වය යහපාලන අවශ්‍යතාවලට අනුකූල විය යුතුය. |

## 1.8 ආයෝජන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ.) | අරමුදල සඳහා අනුමත ආයෝජන ප්‍රතිපත්තියක් නොතිබුණි. කෙටුම්පත් ආයෝජන ප්‍රතිපත්තිය අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර ඇති අතර යෝජිත ආයෝජන සීමාවන් සහිතව නැවත ඉදිරිපත් කරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය නිර්දේශ කර තිබුණි.. කෙසේ වෙතත්, නැවත ඉදිරිපත් කිරීම සිදු කර නොතිබුණි. | අරමුදලට අනුමත ආයෝජන ප්‍රතිපත්තියක් ඇත. ආයෝජන සඳහා තවදුරටත් අවශ්‍ය සීමාවන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධිකාරිය සීමාවන් පැවරීමේ දී අනුමත කරනු ලැබේ. කෙසේ වෙතත්, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසාය සඳහා වන මෙහෙයුම් අත්පොතට අනුව අවම වශයෙන් පසුගිය වසර දෙක තුළ වසරකට රු. බිලියන 30 ක් උපයන රාජ්‍ය වූ ව්‍යාපාර ව්‍යවසායන් සඳහා මෙම අවශ්‍යතාවය අදාල වේ. එබැවින්, මෙම කොටස යටතේ අරමුදල සඳහා එවැනි අවශ්‍යතාවයක් නොමැත. | අරමුදල් ආයෝජනය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම කළමනාකරණය සහතික කළ යුතුය. |
| (ආ.) | අරමුදලේ ආයෝජන ප්‍රතිපත්ති කෙටුම්පතේ 17 වැනි ඡේදයට අනුව ආයෝජන කමිටුව කාලීනව රැස්විය යුතු අතර ආයෝජන කමිටුවේ වගකීම් නිර්වචනය කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා ආයෝජන කමිටුව රැස්වී නොතිබුණි. | රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසාය සඳහා වන මෙහෙයුම් අත්පොත අනුව අවම වශයෙන් පසුගිය වසර දෙක තුළ වසරකට බිලියන රු. 30 ක ආදායමක් ඇති ආයතන සඳහා පමණක් ආයෝජන කමිටුවක් අවශ්‍ය වේ. ඒ අනුව අරමුදලට එවැනි අවශ්‍යතාවයක් නොමැත. | ආයෝජන කමිටුවේ ඵලදායී ක්‍රියාකාරිත්වය සඳහා කළමනාකාරීත්වය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ.) ආයෝජන ප්‍රතිපත්තිය කාලීනව සමාලෝචනය කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ආයෝජන ප්‍රතිපත්තිය තුළ ඇතුළත්ව නොමැත. තවද, ආයෝජන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙන් පසු මණ්ඩලය විසින් එය සමාලෝචනයට ලක් කර නොතිබූ අතර නියමිත වේලාවට ප්‍රතිපත්තියට අවශ්‍ය වැඩිදියුණු කිරීම් ඇතුළත් කර නැත. | නිරීක්ෂණය සමග එකඟ වේ . කෙසේ වෙතත්, එම වගන්තිය යටතේ අළුබැවින් එවැනි අවශ්‍යතාවයක් නොමැත. | මණ්ඩලය විසින් අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි කාලීනව සමාලෝචනය කළ යුතුය. |
| (ඇ.) කෙටුම්පත් ආයෝජන ප්‍රතිපත්තියේ 13 වැනි ඡේදයේ ආයෝජන කළමණාකරුගේ කාර්යභාරය සඳහන්ව ඇතත්, 2020 අගෝස්තු 13 වැනිදා සිට මෙම තනතුර පුරප්පාඩු වී තිබුණි.. | රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසාය සඳහා වන මෙහෙයුම් අත්පොත අනුව අවම වශයෙන් පසුගිය වසර දෙක තුළ වසරකට බිලියන රු. **30** ක ආදායමක් ඇති ආයතන සඳහා පමණක් ආයෝජන කමිටුවක් අවශ්‍ය වේ. ඒ අනුව අරමුදලට එවැනි අවශ්‍යතාවයක් නොමැත. | ආයෝජන කමිටුවේ ඵලදායී ක්‍රියාකාරිත්වය සඳහා කළමනාකාරීත්වය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ.) ආයෝජන ප්‍රතිපත්තිය අනුව, ආයෝජන තෝරාගැනීම පදනම් වන්නේ ආර්ථික තත්ත්වයන්, පොලී අනුපාත හැසිරීම්, අනාගත ප්‍රවණතා සහ අරමුදලේ මෙහෙයුම් මුදල් ප්‍රවාහ අවශ්‍යතා ඇගයීම මත ය. කෙසේ වෙතත්, විචක්ෂණශීලී◌ ලෙස ආයෝජන තීරණ ගැනීම සඳහා අතිරික්ත මුදල් ප්‍රවාහයන් සහ එම මුදල් ප්‍රවාහයන් ඇතිවිය හැකි කාල සීමාව හඳුනා ගැනීම සඳහා මුදල් ප්‍රවාහ පුරෝකථන සකස් කර නොතිබුණි. | මුදල් ප්‍රවාහයන් නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා සකස් කර නොමැත. අරමුදලේ ව්‍යාපාරයේ ස්වභාවය , ද්‍රවශීලතා අවශ්‍යතාවය සහ අරමුදල් ලබා ගැනීමේ හැකියාව අනුව කාලය සහ මුදල පිළිබඳව ආයෝජන තීරණයක් ගැනීමට පෙර දිනපතා නිරීක්ෂණය කරනු ලැබේ. එබැවින්, මුදල් ප්රවාහ අනාවැකි මත නොව සැබෑ සංඛ්‍යා මත පදනම්ව තීරණ ගනු ලැබේ. දෛනික ශේෂ සහ ආයෝජන වාර්තාව මත පදනම්ව දෛනික මුදල් ලබා ගැනීම සහ අතිරික්ත අරමුදල් හඳුනා ගනු ලබයි. දෛනිකව ආයෝජන තීරණ ගැනීමට අවශ්‍ය බැවින්, මූල්‍ය බලතල පැවරීම යටතේ, මණ්ඩලය තම අධිකාරිය අදාළ නිලධාරීන්ට සහ ආයෝජන කමිටුවට පවරා තිබුණි. | විචක්ෂණශීලී ලෙස අනාගත ආයෝජන තීරණ ගැනීම සඳහා මුදල් ප්‍රවාහ පුරෝකතනයක් සකස්කර අනාගත මුදල් ප්‍රවාහ සහ එහි කාලය හඳුනාගැනීම සඳහා කළමනාකරණය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.. |
| (ඊ.) අරමුදලේ මූල්‍ය වත්කම් (ආයෝජන) රු. 24,954,265,916 ක් වන අතර එය මුළු වත්කම් වලින් 79% ක් නියෝජනය කරයි. කෙසේ වෙතත්, ආයෝජන ප්‍රතිපත්තිය තුළ ආයෝජන තීරණ ගැනීම සඳහා මූල්‍ය බලතල පැවරීම ආයෝජනවල වටිනාකම සහ ආයෝජන ප්‍රභවයන් අනුව නිර්වචනය | ආයෝජන සඳහා සියලුම අනුමත සීමාවන් මූල්‍ය බලතල පැවරීම මගින් ලබා දී ඇත. | ආයෝජන ක්‍රියාකාරකම්වල ඵලදායී ක්‍රියාකාරිත්වය සඳහා ආයෝජනයේ වටිනාකම සහ ආයෝජන ප්‍රභවයන් මත පදනම්ව |

| | | |
|---|---|---|
| කර නොතිබුණි. ආයෝජනයේ වටිනාකම සහ ප්‍රභවයන් නොසලකා සියලුම ආයෝජන ආයෝජන කමිටුව විසින් පමණක් අනුමත කර තිබුණි.. | | කළමනාකරණය විසින් මූල්‍ය බලතල පැවරීම කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 4,944,217,918 ක බදු පසු ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 7,526,099,442 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,581,881,524 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම අඩුවීමට පෙර වසරට සාපේක්ෂව ශුද්ධ ප්‍රතිලාභ ගෙවීම් සහ හිමිකම් ප්‍රමාණය රු. 2,806,764,782 කින් වැඩිවීම, ශුද්ධ ඉපැයූ වාරිකය රුපියල් 96,123,417 කින් අඩුවීම සහ රු. 249,059,791 කින් ප්‍රතිරක්ෂණ සහ අත්පත් කර ගැනීමේ පිරිවැය වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| වර්ෂය | 2021 | 2020 | විචලනය රු. | විචලනය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| ශුද්ධ ඉපැයූ වාරිකය | 17,378,904,399 | 17,475,027,816 | (96,123,417) | -1% |
| වෙනත් ආදායම් | 1,590,127,784 | 1,387,023,110 | 203,104,674 | 15% |
| ශුද්ධ ප්‍රතිලාභ සහ හිමිකම් | (10,761,281,045) | (7,954,516,263) | (2,806,764,782) | 35% |
| ප්‍රාරක්ෂණ (Underwritting) සහ අත්පත් කර ගැනිමේ පිරිවැය | (1,863,920,737) | (1,614,860,946) | (249,059,791) | 15% |
| වෙනත් මෙහෙයුම් සහ පරිපාලන වියදම් | (392,242,269) | (409,175,576) | 16,933,307 | -4% |
| ආදායම් බදු | (991,504,005) | (1,339,826,929) | 348,322,924 | -26% |
| වසර සඳහා ලාභය | 4,944,217,918 | 7,526,099,442 | (2,581,881,524) | -34% |

### 2.3 අනුපාත විශ්ලේෂණය

විගණනයට ලබා දී ඇති මූල්‍ය ප්‍රකාශන සහ තොරතුරු අනුව, පසුගිය වසර හතර සඳහා වැදගත් අනුපාත කිහිපයක් පහත පරිදි විය.

| අනුපාතය | 2021 | 2020 | 2019 | 2018 |
|---|---|---|---|---|
| රඳවා ගැනීමේ අනුපාතය | 174% | 161% | 143% | 138% |
| මුළු හිමිකම් අනුපාතය | 58% | 46% | 60% | 72% |
| වියදම් අනුපාතය | 8% | 12% | 16% | 16% |
| ඒකාබද්ධ අනුපාතය | 67% | 57% | 76% | 87% |
| ආදායම් වර්ධන අනුපාතය | 1% | 6% | 18% | 18% |
| ලාභදායිත්ව අනුපාතය | 56% | 90% | 24% | 34% |
| ශුද්ධ ලාභය | 26% | 40% | 18% | 21% |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය | 20% | 37% | 17% | 19% |
| හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය | 38% | 83% | 43% | 47% |
| ද්‍රවශීලතා අනුපාතය | 1.4 | 1.2 | 0.68 | 0.74 |
| ජංගම අනුපාතය | 8.78 | 6.26 | 8.92 | 9.34 |
| මුළු වත්කම්වලට මූල්‍ය වත්කම් අනුපාතය | 81% | 82% | 77% | 76% |
| වත්කම් පිරිවැටුම් අනුපාතය | 1.12 | 1.34 | 2.46 | 2.17 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ.) අරමුදලේ දත්තයන්හි විශ්වාසනීය මට්ටම ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වැඩිදියුණු කිරීම් සිදු කිරීමට අදාළව, දත්ත ග්‍රහණය කර ගැනීම, ව්‍යාපාරයේ ප්‍රධාන කොටස් බෙදීම, හිමිකම් ගණන් සැපයීම සහ හිමිකම් හැසිරවීමේ වියදම් සම්බන්ධයෙන් ජීව ගණක විසින් 2019 වර්ෂයේ සිට නිර්දේශ කර තිබුණි. නමුත් අරමුදලේ දත්තවල විශ්වාසනීය මට්ටම වැඩි දියුණු කිරීම් සඳහා ආයුගණක වාර්තාව අධ්‍යක්ෂක මණ්ඩල මට්ටමින් හෝ සුදුසු කළමනාකරණ මට්ටමින් 2019 වර්ෂයේ සිට සාකච්ඡා කර නොතිබුණි. | රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශයට අවශ්‍ය පරිදි අරමුදල සතුව 75% දත්ත විශ්වාසනීය මට්ටමක් ඇති බැවින්, දත්ත විශ්වාසනීය මට්ටමේ අවශ්‍යතාවය තවදුරටත් වැඩි කිරීම හෝ අඩු කිරීම අවශ්‍ය නොවේ. | අරමුදලේ දත්ත වල විශ්වාසනීය මට්ටම වැඩි දියුණු කිරීම සඳහා ජීව ගණක විසින් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කළමනාකාරීත්වය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ.) අවශ්‍ය ජීව ගණක තොරතුරු රැස් කිරීම, රඳවා තබා ගැනීම සහ ආයුගණක සහ වෙනත් අවශ්‍ය පාර්ශවයන් වෙත සැපයීම සඳහා අරමුදල විසින් ජීව ගණක අංශයක් ස්ථාපිත කර නොතිබුණි. | අරමුදල ජීව ගණක අංශයක් ස්ථාපිත කර නොතිබුණි. ඒනිසා මූල්‍ය අංශය මගින් අදාළ දත්ත ලබා දෙනු ලැබේ. | ජීව ගණක කාර්යයෙහි ඵලදායී ක්‍රියාකාරීත්වය කළමනාකාරීත්වය විසින් සහතික කළ යුතුය |
| (ඇ.) ප්‍රතිරක්ෂණ හිමිකම් ක්‍රියාවලිය හැසිරවීමට සහ ගෙවිය යුතු වගකීම් හඳුනා ගැනීමට අරමුදල සඳහා ලේඛනගත ප්‍රතිපත්තියක් නොතිබුණි. එබැවින්, අරමුදල ප්‍රාථමික දැනුම් දීමේ ලේඛනයෙන් ප්‍රතිරක්ෂණ වගකීම හඳුනාගෙන වාර්තා කරනු ලබයි. | මූලික දැනුම් දීමේ ලේඛනය මත පදනම්ව හිමිකම් සඳහා වෙන්කිරීම් සිදු කරනු ලැබේ. කෙසේ වෙතත්, ව්‍යාපාරයේ ස්වභාවය අනුව තාක්ෂණික අදහස්, අලාභ ගැලපුම් වාර්තා යනාදිය ලැබීමෙන් පසු අවසාන හිමිකම් ප්‍රමාණය තීරණය කරනු ලැබේ. | අරමුදලේ ප්‍රධාන කාර්යයන් සඳහා ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම කළමනාකාරීත්වය විසින් සහතික කළ යුතුය. |
| (ඈ.) රු. 2,726,557 ක කල් ඉකුත් වූ සහන ණය ගිණුම් ශේෂයන් 03 කට අදාළව අරමුදල විසින් 2021 දෙසැම්බර් 31 වන දින දක්වා සිහිකැඳවීම් නිකුත්කර පසු විපරම් කර නොතිබුණි. විගණනය මගින් තොරතුරු ඉල්ලා සිටීමෙන් පසු, 2022 අගෝස්තු 23 දින ප්‍රතිසාධන සිහිකැඳවීම් යවා තිබුණි. | දැනටමත් සිහි කැඳවීම් යැවීමට සහ නැවත අයකර ගැනීමට ක්‍රියා කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස 2022 වර්ෂය තුළ සැලකිය යුතු මුදලක් අයකර ගැනීමට හැකි වී ඇත. | සහන ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කළමනාකාරීත්වය කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ.) 2013 අගෝස්තු 23 දිනැති අංක 1824/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයට අනුව, 2020 සහ 2021 වර්ෂ සඳහා බැංකු සහ මූල්‍ය ආයතන 10 කින් රුපියල් 2,681,980 ක බෝග බද්ද ප්‍රමාදවී ගෙවීම මත දඩ මුදල් පනවා අරමුදලට එකතු කර ගෙන නොතිබුණි. තවද බද්ද නොගෙවීම සම්බන්ධයෙන් 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතේ 24 වැනි ඡේදයේ විධිවිධාන අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අරමුදල නිරීක්ෂණය සමඟ එකඟ වේ. හරහා වුවද, අරමුදල විසින් සිහිකැඳවීම් යවා තිබුණද තවමත් අයකර ගැනීම් සිදුකර ගත නොහැකි විය. | අරමුදල විසින් නියමිත වේලාවට බෝග බද්ද අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඊ.) කාර්යක්ෂම පරික්ෂා කිරීමේ සහ ගෙවීම් ක්‍රියාවලියක් නොමැතිකම හේතුවෙන් අග්‍රහාර ප්‍රතිලාභ ගෙවීමේ දීර්ඝ ප්‍රමාදයක් පවතින බව නිරීක්ෂණය විය. අග්‍රහාර හිමිකම් ප්‍රතිලාභ ගෙවීමේ ප්‍රමාදය සඳහා ඉල්ලුම්පත්‍ර ලියාපදිංචි නොකිරීම සහ ලැබුණු දිනය අනුව ඒවා භාර නොගැනීම, ලැබුණු අවස්ථාවේදී එහි නිරවද්‍යතාවය පරීක්ෂා කර නොගැනීම, හිමිකම් ඉල්ලුම්පත්‍ර ලැබුණු බවට ලිඛිත සහතිකයක් ලබා නොදීම සහ පරිගණක පද්ධතියේ දුර්වලතා සහ අභ්‍යන්තර පාලන ගැටළු ආදිය හේතු වී ඇති බව නිරීක්ෂණය විය. තවද, එම ප්‍රමාදය සාමාන්‍යයෙන් දින 200 සිට 240 දක්වා වන බව නිරීක්ෂණය විය. | දැනට, කවුන්ටර වෙත ඉදිරිපත් කරන ලද අග්‍රහාර හිමිකම් අයදුම්පත් පරීක්ෂා කර භාර ගන්නා අතර සති දෙකක් ඇතුළත ගෙවීම් සිදු කෙරේ. වැරදි හැසිරවීම සඳහා ද එම ක්‍රියා පටිපාටිය අනුගමනය කරනු ලැබේ. තැපැල් මගින් ලැබෙන අයදුම්පත් සඳහාද පහත පරිදි ගෙවීම් කිරීමට මෙම ක්‍රියාවලිය තවදුරටත් වැඩිදියුණු කිරීමට සැලසුම් කර ඇත.<br>- තැපෑලෙන් ලැබෙන අග්‍රහාර හිමිකම් අයදුම්පත් පරීක්ෂා කර භාර ගැනීම.<br>- අවශ්‍ය ලියකියවිලි සමඟ නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් සඳහා කුවිතාන්සියක් නිකුත් කිරීම..<br>- පළමු පියවරේදීම අසම්පූර්ණ හිමිකම් අයදුම්පත් සඳහා වැඩිදුර ලියකියවිලි ඉල්ලා ලිපියක් යැවීමට කටයුතු කිරීම..<br>- එසේම, ඉදිරි සති දෙක තුළ එකතු වී ඇති අයදුම් පත්‍ර සඳහා ගෙවීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා වෙනම කණ්ඩායමක් යෙදවීම..<br>- පරිගණක පද්ධතියේ කිසියම් දෝෂයක් ඇති වූ විට, එම දෝෂය තොරතුරු තාක්ෂණ අංශය මගින් නිවැරදි කරනු ලබන අතර එය දෝෂ අවම කර ගැනීමට සහ පද්ධතියේ වර්ධනයන් සඳහා අභ්‍යන්තර පාලනයේ යම් සීමාවන් ඇති කිරීම සිදු කරයි.. | කළමනාකාරීත්වය තම අභ්‍යන්තර හිමිකම් හැසිරවීමේ ක්‍රියා පටිපාටිය වැඩිදියුණු කිරීමෙන් හිමිකම් ගෙවීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කළ යුතුය. |
| (උ.) ගනුදෙනුකරුවන්ට ගුණාත්මක හා කඩිනම් සේවාවක් සැපයීම සඳහා පිරිවැය රුපියල් මිලියන 21.5 ක් වැයකර අංග සම්පූර්ණ ඇමතුම් | අරමුදල ලබා දී ඇති නිර්දේශයට එකඟ වන අතර වත්මන් තත්ත්වය පහත පරිදි වේ;<br>- අග්‍රහාර ගෙවීම් ප්‍රමාද වීම | කළමනාකාරීත්වය විසින් පාරිභෝගික සේවා හැසිරවීමට සහ හිමිකම් ඉල්ලීම් නියමිත වේලාවට |

මධ්‍යස්ථානයක් 2021 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදි. එමඟින් සේවාදායකයින් 15 දෙනෙකුට එකවර සේවා සැපයීමේ හැකියාව ඇත. මේ වන විට දිනකට ලැබෙන සාමාන්‍ය දුරකථන ඇමතුම් සංඛ්‍යාව 1,700ක් පමණ වන බව නිරීක්ෂණය වූ අතර ස්ථාපිත කරන ලද දිනය වන 2021 පෙබරවාරි සිට 2022 දෙසැම්බර් දක්වා එම ඇමතුම් මධ්‍යස්ථානයට ලැබුණු මුළු ඇමතුම් සංඛ්‍යාව 734,626කි. ඉන් පිළිතුරු ලබා දුන් මුළු ඇමතුම් සංඛ්‍යාව 312,350 ක් වන අතර ප්‍රතික්ෂේප වූ ඇමතුම් සංඛ්‍යාව 422,250 කි. ඒ අනුව ඇමතුම් මධ්‍යස්ථානයට ලැබුණු මුළු ඇමතුම් සංඛ්‍යාවෙන් සියයට 57ක් ප්‍රතිචාර දැක්වීමකින් තොරව ප්‍රතික්ෂේප වී ඇත. එබැවින්, ආයතනයේ නිල සමාජ මාධ්‍ය හරහා සේවාදායකයින් විසින් ඔවුන්ගේ ගැටළු විසඳීම සහ සපයන සේවාවන් පිළිබඳව සිය අප්‍රසාදය පළ කර තිබුණි. එම ඇමතුම් මධ්‍යස්ථානයට ප්‍රමාණවත් සහ පුහුණු කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කිරීමට අරමුදලේ කළමනාකාරීත්වය අපොහොසත් වී ඇති බව විගණනයේ දී අනාවරණය විය. භෞතික නිරීක්ෂණයට අනුව එම ඇමතුම් මධ්‍යස්ථානයේ සේවයේ නියුතු සේවක සංඛ්‍යාව 4-5ක් තරම් සුළු පිරිසක් බව නිරීක්ෂණය විය.. තවද මෙම ඇමතුම් මධ්‍යස්ථානයට ලැබෙන ඇමතුම් ප්‍රමාණය දිනෙන් දින ඉහළ යාමට හේතුව අග්‍රහාර හිමිකම් සාධාරණ කාලයක් තුළ නොගෙවීම බවද අනාවරණය විය.

හේතුවෙන් දිනකට ලැබෙන ඇමතුම් සංඛ්‍යාව 2000ක් පමණ දක්වා ඉහළ ගොස් ඇති බව නිරීක්ෂණය වේ. ඇමතුම් මධ්‍යස්ථාන නියෝජිතයින් 15 දෙනෙකුට පවා දිනකට සාමාන්‍ය ඇමතුම් 1,200-1,500ක් හැසිරවිය හැකි නමුත් 2,000 සීමාව සපුරාලීමට නොහැකිය.

- තව දුරටත් 2021-2022 රාජ්‍ය අංශයේ බඳවාගැනීම් සීමා කිරීම් සමඟ, 2022 දෙසැම්බර් මස අවසන් වන විට ඇමතුම් මධ්‍යස්ථානය ස්ථිර කළමනාකරණ සහකාරවරුන් 4-5 දෙනෙකු සමඟ පමණක් හැසිරවීමට සිදු විය. කෙසේ වෙතත්, 2023 වර්ෂයේ සිට ස්ථිර සහකාරවරුන් 04 දෙනෙකු සහ අභ්‍යාසලාභී කාර්ය මණ්ඩලය 12 දෙනෙකු අනුයුක්ත කර ඇති අතර 2023 ජනවාරි සිට සම්පූර්ණ නියෝජිතයින් 15 දෙනෙකුගෙන් යුත් ඇමතුම් මධ්‍යස්ථානය ක්‍රියාත්මක වේ.

- අරමුදල විසින් එකතු වී ඇති අග්‍රහාර අයදුම්පත් සඳහා ගෙවීමේ ක්‍රියාවලිය කඩිනම් කර මාස 02ක් ඇතුළත හිඟ මුදල් සම්පූර්ණ කිරීමට සැලසුම් කර ඇති අතර නියමිත කාලය තුළ ඇමතුම් සංඛ්‍යාව අඩු වනු ඇත.

සැකසීමට ඇමතුම් මධ්‍යස්ථානයට ප්‍රමාණවත් සහ නිපුණ මානව සම්පත් වෙන් කළ යුතුය.

## 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ.) 2008 මාර්තු 25 දිනැති අංක 1542/11 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 3(1) ඡේදයට අනුව, වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදය සඳහා වන අරමුදල සඳහා රක්ෂණ ඔප්පු නිකුත් කිරීමෙන් අයකර ගන්නා වාරිකය රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යන ගිණුමකට බැර කළ යුතුය. කෙසේ වෙතත්, නිසි නීතිමය ප්‍රතිපාදන නොමැතිව රක්ෂණ සමාගම් වෙත 20% ක කොමිස් මුදලක් ලබා දීමෙන් අනතුරුව මෝටර් නොවන රක්ෂණ ගිවිසුම සඳහා අය කළ වාරිකය අරමුදලට බැර කර ඇත. සමාලෝචිත වර්ෂය සඳහා මෝටර් නොවන රක්ෂණ ගිවිසුම්වලින් කොමිස් ලෙස ලබා දී ඇති මුදල රු. 1,087,484,898 කි. | මෝටර් නොවන දළ වාරිකය (100%) ඉන්වොයිස් කර වාරික ආදායම ලෙස සටහන් කර ඇත. කෙසේ වෙතත්, ප්‍රාථමික රක්ෂණකරුගේ අලෙවිකරණ සහ පරිපාලන පිරිවැය ආවරණය කිරීම සඳහා ජාතික රක්ෂණ භාර අරමුදල විසින් 20% කොමිස් මුදලක් ගෙවිය යුතුය. සාමාන්‍ය සමාගම්වලින් 20% කොමිස් මුදලක් සඳහා බැරපත ලැබෙන අතර ජාතික රක්ෂණ භාර අරමුදල විසින් එය පියවිය යුතුය. ඒ වෙනුවට ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ගෙවිය යුතු බැරපත කොමිස් මුදල පියවීමේ ඉන්වොයිසියෙන් අඩු කර ගැනීමට ඉඩ සලසා ඇත. | වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදය ආවරණය සඳහා වන අරමුදල සඳහා මෝටර් රථ නොවන රක්ෂණ ඔප්පු නිකුත් නිකුත් කිරීමෙන් ලබා ගන්නා වාරික සඳහා කොමිස් ගෙවීමේ නීත්‍යානුකූලභාවය පිළිබඳව අරමුදල විසින් ඇගයීමට ලක් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ.) 2008 මාර්තු 25 දිනැති අංක 1542/11 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 3(1) ඡේදයට අනුව වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදය සඳහා වන අරමුදල සඳහා රක්ෂණ ඔප්පු නිකුත් කිරීමෙන් අය කරන වාරිකය රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යන ගිණුමකට බැර කළ යුතුය. කෙසේ වෙතත්, මෝටර් රථ රක්ෂණ ඔප්පු සඳහා වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදය ආවරණය කිරීමට රක්ෂණ සමාගම්වලින් අයකර ගන්නා ලද සම්පූර්ණ වාරිකයෙන්, අරමුදල අයකරගෙන ඇත්තේ 12%ක් පමණක් වන අතර ඒ සඳහා නිසි නීතිමය ප්‍රතිපාදන නොමැත. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලට රු. 9,596,748,087 ක අඩුවෙන් අය කරගෙන ඇත. | වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සඳහා වන අරමුදල ආරම්භයේ සිට මෝටර් රථ පන්තිය සඳහා ක්‍රියාත්මක කරන ලද Motor XOL විධිවිධානයන් (Arrangements) ජාතික රක්ෂණ භාර අරමුදල විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද අතර , ඒ අනුව මෝටර් පන්තියේ අතිරික්ත අලාභ විධිවිධානය (the motor class Excess of Loss arrangement) (XOL) යටතේ අය කරන වාරිකයේ ප්‍රතිශතය කලින් කලට තීරණය කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක. 53-16 අනුව වාරික වශයෙන් ලබාගත් මුදල රක්ෂණ සමාගම් විසින් එකතු කරන මුළු වාරිකයෙන් 12% කි. කෙසේ වෙතත්, 12% තීරණය කිරීමට පෙර, එම වසරේම මුළු වාරිකයෙන් 15% ක් ඉල්ලා සිටි අතර, එම තීරණයට කර්මාන්තය විරුද්ධ වීම නිසා එය අවසානයේ 12% දක්වා අඩු විය.2021 දී ජාතික රක්ෂණ භාර අරමුදල හි කළමනාකාරිත්වය XOL විධිවිධානයේ වර්තමාන පරිචය නතර කිරීමට අවස්ථාව ලෙස හදුනාගත් බැවින්, මෝටර් වාරික එකතු කිරීමේ වර්තමාන | වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදය ආවරණය සඳහා වන අරමුදල සඳහා මෝටර් රථ රක්ෂණ ඔප්පු නිකුත් නිකුත් කිරීමෙන් ලබා ගන්නා වාරික සඳහා කොමිස් ගෙවීමේ නීත්‍යානුකූලභාවය පිළිබඳව සමාගම විසින් ඇගයීමට ලක් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| | භාවිතය වෙනස් කිරීම සහ 2022.04.01 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවේ අංක 172-03 ට අනුව පරිදි මෝටර් රථ රක්ෂණ වගකීම 100% ක වාරික සහිතව භාර ගැනීමට 100% තීරණය කරන ලදී. මෙය ක්‍රියාත්මක කිරීමේදී කර්මාන්තය විරුද්ධ වූ බැවින් තීරණය ක්‍රියාත්මක කිරීම කල් දැමීය. | |
| (ඇ.) 2007 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් (සංශෝධිත) පනත සහ 2012 දෙසැම්බර් 21 දිනැති අංක 1791/4 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට අනුව, ශ්‍රී ලංකාව තුළ සාමාන්‍ය (ජීවිත නොවන) ප්‍රතිරක්ෂණවලින් 30% ක කොටසක් අනිවාර්යයෙන්ම අරමුදල තුළ ප්‍රතිරක්ෂණය කළ යුතුව ඇත. කෙසේ වෙතත්, අනිවාර්ය කොටස ප්‍රතිරක්ෂණය කරන ප්‍රතිරක්ෂණකරුවන්ට අරමුදල කොමිස් මුදලක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. අරමුදල විසින් 2017 සිට 2020 වසර දක්වා සාමාන්‍ය රක්ෂණ සමාගම් 13කට පෙර කී අනිවාර්ය කොටස සඳහා ප්‍රතිරක්ෂණ කොමිස් මුදල් ලෙස රු. 7,390,263,635 ක් නිසි නීතිමය ප්‍රතිපාදන නොමැතිව ගෙවා ඇත. | ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයේ ස්වභාවය සහ භාවිතය අනුව, ශ්‍රී ලංකාවේ ප්‍රාථමික රක්ෂණ සමාගම් විදේශීය ප්‍රතිරක්ෂණ මණ්ඩලය සමඟ තම ප්‍රතිරක්ෂණ ආවරණ සකස් කරමින් සිටින අතර අනිවාර්ය 30% ක ප්‍රතිරක්ෂණ කොටසක් සහිත ජාතික රක්ෂණ භාර අරමුදල කමිටුවට තවත් එක් ප්‍රතිරක්ෂණකරුවකු පමණක් බවට පත් වේ. කෙසේ වෙතත්, ඉහළ අවදානම් ප්‍රතිශතයක් භාරගනු ලබන ප්‍රධාන ප්‍රතිරක්ෂණකරු(lead reinsurer) සමඟ ප්‍රතිරක්ෂණ ගිවිසුම මුලින් එකඟ වී අත්සන් කරන ලදී. ප්‍රතිරක්ෂණ සම්මතයන් අනුව, ප්‍රතිරක්ෂණ කමිටුවේ අනෙකුත් සියලුම ප්‍රතිරක්ෂණකරුවන් එකම නියමයන් සහ කොන්දේසි අනුගමනය කරයි. එබැවින්, ප්‍රතිරක්ෂණ නායකයා විසින් මුලින් එකඟ වනු ලබන කොමිස් ප්‍රතිශතය ජාතික රක්ෂණ භාර අරමුදල විසින් පිළිගත යුතුය. | අනිවාර්ය සියයට 30 ක ප්‍රතිරක්ෂණ ආවරණයෙන් එකතු කරන වාරික සඳහා කොමිස් ගෙවීමේ නීත්‍යානුකූලභාවය සඳහා සමාගම විසින් ඇගයීමට ලක් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |